www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 4 ඒකකය |
|---|---|---|

## සමාධිගත සිතක මහිම

### I කොටස

**01. නිවැරදි පිළිතුර ලකුණු කරන්න.**

1. භාවනා යන්නෙහි අර්ථය වන්නේ,
   - i. සිත, කය, වචනය සංවර කිරීමයි.
   - ii. කුසල් දහම් වැඩිදියුණු කිරීමේ මානසික අභ්‍යාසයයි.
   - iii. සතර ඉරියව්වල හික්මීමයි.
   - iv. කය වචනය දෙකෙහි සංවරභාවයයි.

2. බෞද්ධ භාවනා ප්‍රධාන වශයෙන් කොටස්,
   - i. 02 කි
   - ii. 04 කි
   - iii. 05 කි
   - iv. 10 කි

3. ත්‍රිවිධ කුසල චේතනා වනුයේ,
   - i. ලෝභ, දේස, මෝහ වේ.
   - ii. චිත්ත, චෛතසික, රූප වේ.
   - iii. අලෝභ, අදෝස, අමෝහ වේ.
   - iv. සීල, සමාධි, ප්‍රඥා වේ.

4. ණයගැතියකු ණය හිමියකුට උපමා කර ඇති නීවරණය වනුයේ,
   - i. ව්‍යාපාදයටය
   - ii. විචිකිච්ඡාවටය
   - iii. කාමච්ඡන්දයටය
   - iv. ථීනමිද්ධයටය

5. කුසල යන්නෙහි අර්ථ වනුයේ,
   - i. රෝගී, වැරදි, අදක්‍ෂ යන්නයි.
   - ii. නිරෝගී, නිවැරදි, දක්‍ෂ යන්නයි.
   - iii. ලෝභ, දෝස, මෝහ යන්නයි.
   - iv. අලෝභ, අදෝස, අමෝහ යන්නයි.

6. භාවනා කර්මස්ථාන ලබාදීමට පෙර භාවනා ගුරුවරයා පුද්ගල චරිත හඳුනාගනී. එම චරිත සංඛ්‍යාත්මකව,
   - i. 06 කි
   - ii. 08 කි
   - iii. 10 කි
   - iv. 12 කි

7. පංච නීවරණ පිළිබඳ ඇතුළත් සූත්‍රයක් වන්නේ,
   - i. මහා පරිනිබ්බාණ සූත්‍රය
   - ii. අග්ගඤ්ඤ සූත්‍රය
   - iii. ගිරිමානන්ද සූත්‍රය
   - iv. සාමඤ්ඤඵල සූත්‍රය

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

8. ව්‍යාපාදය අධික වූවෙක් ප්‍රගුණ කළ යුතු භාවනාවක් වනුයේ,
   i. බුද්ධානුස්සතියයි
   ii. මෙත්තානුස්සතියයි
   iii. කායගතාසතියයි
   iv. ආනාපානසතියයි

9. සමථ භාවනාවේ කර්මස්ථාන ගණන වනුයේ,
   i. 20 කි
   ii. 30 කි
   iii. 40 කි
   iv. 50 කි

10. පංච අභිඥා නිවැරදිව ඇති වර්ණය වන්නේ,
   i. ඉද්ධිවිධ ඥානය, දිබ්බසොත, පරචිත්ත විජානන, පුබ්බේනිවාසානුස්සති, චුතූප්පාත ඥානය
   ii. ප්‍රථම ධ්‍යාන, දුතිය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්විධ ධ්‍යාන, ආකාසානඤ්ඤායතනය
   iii. ලෝභ, දේස, මෝහ, තණ්හා, මාන
   iv. ලෝභ, දේස, මෝහ, මාන, තණ්හා

## II කොටස

- **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

02. 1. භාවනාවේ පුද්ගල චරිත ස්වභාවය අනුව හයකි. හතරක් නම් කරන්න.
   2. ෂඩ් ඉන්ද්‍රිය නම් කරන්න.
   3. අෂ්ට සමාපත්ති සඳහන් කරන්න.
   4. සමථ භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන පහක් නම් කරන්න.
   5. විපස්සනා යන්නෙහි අර්ථය සඳහන් කරන්න.
   6. පංචස්කන්ධය නම් කර නාම රූපවලට බෙදා සඳහන් කරන්න.
   7. විපස්සනා භාවනාවෙන් ලැබිය හැකි උසස්ම අවබෝධ කරගත හැකි උපරිම අධ්‍යාත්මික දියුණුව කුමක්ද?
   8. විපස්සනා භාවනාව හඳුන්වන සමාන නම් දෙකක් සඳහන් කරන්න.
   9. අනුස්සති භාවනා තුනක් නම් කරන්න.
   10. වනයක අතරමන් වූවෙකුට උපමාකර සසර ගමනේ අතරමංවීම සිදුවන්නේ කිනම් නීවරණයෙන් අගතිගාමී වූ විටද?

03. 1. භාවනාවට අනුව පුද්ගල චරිත නම් කරන්න.
   2. භාවනාවට උපදෙස් ලබා දෙන ගුරුවරයා හඳුන්වන නාමය සඳහන් කරන්න.
   3. පංච නීවරණ ධර්ම යටපත් වීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ පැහැදිලි කරන්න.

04. 1. භාවනා කරන්නා හඳුන්වන පාලි භාෂිත නාමය සඳහන් කරන්න.
   2. විදර්ශනා භාවනාව හඳුන්වන වෙනත් නම් දෙකක් සඳහන් කරන්න.
   3. විපස්සනා භාවනාව පුහුණු කිරීම නිසා ලෝකය හා සත්වයා පිළිබඳ යථා ස්වභාවය හඳුනාගෙන අල්පේච්ඡ ජීවිත ගත කිරීමට හුරුවේ. පැහැදිලි කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!